Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

ශ්‍රේණිය - 10 | විෂය - කෘෂි හා ආහාර තාක්ෂණය | සතිය - දෙසැම්බර් 03 සතිය

01) තිරසර පාසල් සංවර්ධන වැඩසටහන යටතේ පාසල් ගොවිපළක් සැකසීමට ඇතුගල මහා විද්‍යාලයේ සිසු දරුවන් සැලසුම් කරන ලදී. එහිදී ප්‍රදේශයේ භූ විෂමතාව හා පාරසරික තත්ව යටතේ සුදුසු බෝග වගාව සිදු විය යුතු බවට යෝජනා විය. මෙම ප්‍රදේශයේ වාර්ෂික වර්ෂාපතනය 1800 mm ක් ද භූමිය බෑවුම් විය.

1. මෙම පාසල අයත් දේශගුණික කලාපය විය හැක්කේ කුමක්ද ?
2. මෙම ගොවිපල සැකසීමේදී විශේෂ අවධානය යොමු කළ යුතු කරුණු 2ක් ලියන්න.
3. මෙම වගා භූමියේ සංස්ථාපනය කළ හැකි බෝග කාණ්ඩ 4ක් දක්වන්න.
4. පසට කාබනික පොහොර එකතු කිරීමේ වාසි දෙකක් සඳහන් කරන්න.
5. සාපේක්ෂ ආර්ද්‍රතාවයේ හිතකර බලපෑම් දෙකක් ලියන්න.
6. ජල සම්පාදනය යන්න අර්ථ දක්වන්න.
7. පාංශු මහා ජීවීන් දෙදෙනෙක් නම් කරන්න.